ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 11,439—1958 ජුලි 27 වැනි ඉරිදා—27.7.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**පී. ඇල්. 6 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍යය.**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

පොළොන්නරු පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් චාර්ල්ස් අබේදීර වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 ජුලි 21 වැනි දින, අංක 11,367 දරණ ලංකාණ්ඩුවේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 ජුනි 16 වැනි දින හා පී. ඇල්. 4 දරණ ආහාර මිළ නියෝගයේ උපලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් මසූර් පරිප්පු, උලුඳු (පියලි නොකළ), කඩල පරිප්පු සහ අර්තාපල් පිළිබඳව එම උපලෙඛනයේ 3 සහ 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම, තොග වෙළඳ මිලද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම, සිල්ලර වෙළඳ මිළ ද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද එකී උපලෙඛනයේ 2 වැනි තීරයේ සඳහන් පෙදෙස්වල විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් එම උපලෙඛනයේ 3 වැනි හා 4 වැනි තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය පිළිබඳ ව 1958 ජුනි 21 වැනි දින අංක 11,367 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 ජුනි 16 වැනි දින හා පී. ඇල්. 4 වැනි මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ජෙදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගත වූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජුලි මස 21 දින පෙරවරු 10 ට පොළොන්නරුවේ කච්චේරියේ දී අත්සන් තබන ලදී.

සී. අබේදීර,
සහකාර ආහාර මිළ පාලක තැන,
පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය.

උපලෙඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| විස්තර | කොට්ඨාශය | තොග වෙළෙන්දෙකු සිල්ලර වෙළෙන්දෙකුට දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැක වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| මයිසූර් පරිප්පු | සිංහල පත්තු | 54 99 | 0 57 |
| | මැද පත්තු | 55 17 | 0 57 |
| | එගොඩ පත්තු | 55 98 | 0 58 |
| උලුඳු (පියලි නොකළ) | සිංහල පත්තු | 47 76 | 0 49 |
| | මැද පත්තු | 48 07 | 0 49 |
| | එගොඩ පත්තු | 48 74 | 0 50 |
| කඩල පරිප්පු | සිංහල පත්තු | 40 80 | 0 42 |
| | මැද පත්තු | 40 93 | 0 42 |
| | එගොඩ පත්තු | 41 22 | 0 43 |
| අර්තාපල් | සිංහල පත්තු | 29 75 | 0 33 |
| | මැද පත්තු | 29 85 | 0 33 |
| | එගොඩ පත්තු | 30 29 | 0 33 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන් ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී

2001—ජේ. ඇන්. ආර් 25232—4,021 (7/58)